# 500 දෙව් සමිඳු මිදි උයනේ

දෙව් සමිඳු මිදි උයනේ සරු ඇස්වැන්න පැසිලා
එහි එල නෙලන්නට කිතුනු අපහට ඇරයුමක් ලැබිලා
දිරි වඩා සවි වඩා අපි පිය නගමු ඉදිරි බලා //
ආරාධනා // කිතුනු ලක් දරුවනේ //

සමිඳු සුපුවත පතල කරනට ඇරයුමක් ලැබිලා
අඳ වුවත් හට පෙනුම දෙන්නට ඇරයුමක් ලැබිලා
දිරිවඩා සවි වඩා අපි පිය නගමු ඉදිරි බලා //
ආරාධනා // කිතුනු ලක් දරුවනේ //

රෝගී අය වෙත සුවය දෙන්නට ඇරයුමක් ලැබිලා
සමිඳු ප්‍රේමය ලොවට බෙදනට ඇරයුමක් ලැබිලා
දිරිවඩා සවි වඩා අපි පිය නගමු ඉදිරි බලා //
ආරාධනා // කිතුනු ලක් දරුවනේ //